ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2008

**ESC 2219 - මුල් ළමාවියේ කෙළි සෙල්ලම්**

කාලය - පැය තුනයි.

---

දිනය - 2008 අගෝස්තු 29 වන දින        වේලාව - ප.ව.01.30- ප.ව.04.30

---

ප්‍රශ්ණ හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. i. ළමා සෙල්ලම් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. පෙර පාසල් ළමයින්ගේ සමාජ සංවර්ධනය හා චාලක හැකියා සංවර්ධනය සඳහා උදව් විය හැකි සෙල්ලම් ක්‍රියාකාරකම් 02 ක් ඔබ සංවිධානය කර ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කරන්න.
(ලකුණු 15)

02. i. එක් හැවිරිදි බිළිඳකු තුල චාලක ක්‍රියා තුළින් සංවර්ධනය වන කුසලතා පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. එම කුසලතා සංවර්ධනය කර ගැනීමට බිළිඳකුට ඔහුගේ/ඇයගේ නිවසේ පරිසරය තුළ සැලසී ඇති ඉඩ ප්‍රස්ථා ගැන විමසන්න.
(ලකුණු 15)

03. පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.

i. පරිකල්පනික සෙල්ලම් (ලකුණු 12 1/2)

ii. ගවේෂණාත්මක සෙල්ලම් (ලකුණු 12 1/2)

04. i සම්ප්‍රදායානුකුල එළිමහන් ක්‍රීඩා තුනක් (03) නම් කරන්න. (ලකුණු 06)

ii. ඉන් ඕනෑම දෙකක් (02) තෝරාගෙන ඒවා ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

iii. ඒ තුළින් දරුවාගේ ආකල්ප වර්ධනය හා නිර්මාණාත්මක හැකියා වර්ධනය සිදුවන ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 09)

05. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් (02) ක් විමසන්න.

i. සෙල්ලම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී ගුරුවරියට අයත් කාර්ය භාරය
(ලකුණු 12 1/2)

ii. ක්‍රීඩා තේමාවක් තුළින් විෂය සමෝධානිත අත්දැකීම් ලබා දීම.
(ලකුණු 12 1/2)

iii. වැලි සහ වතුර සමග සෙල්ලම් කිරීම.
(ලකුණු 12 1/2)

06. ක්‍රීඩාව පෙර පාසල් අධ්‍යාපනයේ අරමුණු ඉටු කර ගත හැකි ප්‍රධානතම ක්‍රමයයි. උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි. -